# An Investigative Study of the Usage of Hidden Concepts in Tāntric Buddhism

## තාන්ත්‍රික බුදුසමයේ ගුප්ත සංකල්ප භාවිතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

### හැඳින්වීම

භාරතීය බෞද්ධ දර්ශන ඉතිහාසයේ පසුකාලීනව බිහි වූ ජනප්‍රිය බෞද්ධ දර්ශනවාදය ‘තාන්ත්‍රික බුදුදහම’ නමින් හැඳින් වේ. මෙය මුල් කාලයේ ‘මන්ත්‍රයානය’ ‘තන්ත්‍රයානය’ නමින් හැඳින් වූ අතර, පසුව ඒ ඇසුරෙන් වර්ධනය වී ‘වජ්‍රයානය’ නමින් ශාස්ත්‍රීය ලෝකයේ ව්‍යවහාරයට පත්විය. බෞද්ධ චින්තනයේ හිනයාන සම්ප්‍රදායයන් මහායාන සම්ප්‍රදායයන් හා සාපේක්ෂකව විමසීමේ දී මෙම නවතම බෞද්ධ සම්ප්‍රදායෙහි මූලධර්මයන් හා මතවාදයන් අනුව එය ද විශේෂ වූ වර්ධනයක් පිළිබිඹු කරන බැවින් ‘යාන’ ශබ්දයම එකතු කොට ‘තන්ත්‍රයානය’ හෝ ‘වජ්‍රයානය’ යනුවෙන් විශේෂ අවධානයක් සහිතව හඳුන්වා දී ඇත. නමුත් මෙම සම්ප්‍රදාය පිළිබඳ අදහස් දක්වන්නා වු බොහෝ විද්වතුන් මෙය මහායාන සම්ප්‍රදායෙහි ප්‍රසාරණයක් හෝ වර්ධනයක් ලෙස හඳුන්වා දීමට යොමු වී ඇත. අන්‍ය බෞද්ධ සම්ප්‍රදායයන්ට වඩා තාන්ත්‍රික බුදුසමයෙහි සුවිශේෂත්වය ප්‍රකට වන්නා වූ හේතුව නම් ලෞකික මෙන් ම ලෝකෝත්තර අරමුණු සඵල කරගැනීම සඳහා සරල වූ ක්‍රියාමාර්ග විවිධ වූ උපායමාර්ග ලෙස භාවිත කිරීම යි. එසේම එම බොහෝ ඉගැන්වීම් ගුප්ත ධර්මයන් ලෙස ක්‍රියාත්මක කිරීම ද මෙහි දක්නට ඇති තවත් සුවිශේෂි ලක්‍ෂණයකි. තන්ත්‍ර, මන්ත්‍ර, ධාරණී, මුද්‍රා, මණ්ඩල ආදි සංකල්ප තුළින් තාන්ත්‍රික බුදුසමය තුළ විග්‍රහ වන්නේ මෙකී ලෞකික ලෝකෝත්තර අර්ථ සාධනයයි. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් මෙම ගුප්ත ධර්මයන්ගේ භාවිතාව පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්‍ෂිත ය.

### සාරාංශය

මානව සන්හතියේ ආරම්භය යම් කලෙක සිදු වූයේ ද එකල ‘තන්ත්‍ර’ ශාස්ත්‍රයේ ආරම්භය වූ බව බොහෝ විද්වත් පිළිගැනීම යි. මෙම නිසා ‘තන්ත්‍ර’ කවදා, කවරෙකු විසින්, කෙසේ ආරම්භ කරන ලද්දේදැයි දැක්වීම ශාස්ත්‍ර විරෝධී ය. ‘තන්ත්‍ර’ නමින් හඳුන්වන ක්‍රියාවලිය මිනිසාගේ වැදගත් අංග දෙකක් නියෝජනය කරයි. එනම් ශබ්දය හා චලනය යි. සන්නිවේදනයේ දී ප්‍රබල වූ සාධක වන්නේ ද මෙම අංග දෙකයි. සමාජගත වූ මිනිසා සිය ජීවනෝපාය පිණිස විශ්ව ශක්තීන් උපයෝගි කොට ගත්හ. අව්ව, වැස්ස ඒ අතර ප්‍රධාන සාධකයෝ ය.  මෙම විශ්ව සාධක මිනිසාගේ අවශ්‍යතාවයන් අනුව මෙහෙයවාගන්නේ කෙසේ ද, ඒවා තමාට අවශ්‍ය ආකාරයෙන් පාලනය කිරීම පිණිස කුමක් කළ යුතු ද යන ගැටලුව සඳහා ඉහත  සන්නිවේදනයේ ප්‍රබල මාධ්‍යයන් දෙක ලෙස සැළකූ ශබ්දය හා චලනය මිනිසා බාහිර ලෝකය මෙහෙයවිම පිණිස ද ප්‍රමාණවත් යැයි කල්පනා කළ හ. විශ්වශක්තීන් වන සූර්යයා, චන්ද්‍රයා, වර්ෂාව, සුළග ‘දේව’ යන පදයෙන් හැඳින්වීමත් සමඟ මෙම දෙවිවරු ජීව ගුණයෙන් යුත් ප්‍රාණීන් ලෙස සමාජගත වීම ‘තන්ත්‍ර’ නැමැති ගුප්ත ශාස්ත්‍රයේ දියුණු වීම පිණිස හේතු විය. ස්වල්ප

උත්සහයකින් තම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සරල මාර්ගයක් සෙවූ මිනිසා 'තන්ත්‍ර' හෙවත් ශබ්ද ශක්තීන් උපයෝගි කොටගෙන තම අභිමතාර්ථ සාධනය පිණිස යොමු වූහ. සරල ක්‍රමවේදයන් ඔස්සේ ඇරඹි මෙම ක්‍රියාවලිය මෙලොව පරලොව අභිමථාර්ථ පිණිස යොදාගත හැකියැයි විශ්වාස කිරීමත් සමඟ සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත්විය. භාරතයේ පමණක් නොව ලෝකයේ විවිධ රටවල යම් යම් වෙනස්කම් සහිතව ඇරඹුණු මෙවැනි ගුප්ත ක්‍රමවේද වර්තමානය දක්වා ක්‍රියාත්මකව පවතියි.

භාරතය තුළ ප්‍රාග් වෛදික සමාජයේ මෙවන් ගුප්ත ශාස්ත්‍ර ක්‍රියාත්මක වූ බවට හරප්පා, මොහෙන්දොජාරො ශිෂ්ටාචාරයන් සාක්ෂි දරයි. විශේෂයෙන් ස්වභාවදහම දේවත්වයට නැගීමත්, දෙවියන්ගේ විවිධ වූ ශක්තීන් හඳුනා ගැනීමත්, දෙවියන් හා මිනිසුන් අතර සන්නිවේදන මාධ්‍යය ලෙස 'තන්ත්‍ර' භාවිතයත් සමඟ ලෞකික, ලෝකෝත්තර අපේක්ෂා සමෘද්ධිය භාරතයට සුවිශේෂ වූවකි.

කිසියම් ශබ්දයක් මගින් විශ්ව ශක්තීන් මෙහෙයවීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීමත් සමඟ ශබ්දය පමණක් නොව භෞතික වස්තූන් ද එයට සම්බන්ධ කරගෙන ඇත. නිදසුන් ලෙස වේද මන්ත්‍ර ගායනය ගිතෙල් ආදි ආහාර ද්‍රව්‍ය පූජාවන් සමඟ සිදුවිය. වෛදික, බ්‍රාහ්මණ යුගයන්හි බාහිර ලෝකයේ ශක්තීන් තම අවශ්‍යතා සඳහා හසුරුවාලීමට උත්සහගත් මිනිසා ආරණ්‍යක, උපනිෂද් යුගයන්හි ආධ්‍යාත්මික ශක්තීන් කෙරෙහි නැඹුරු වූ බවක් පෙනේ. මෙහි දී විශ්ව ශක්තිය ආධ්‍යාත්මික ශක්තිය හා සමාන කොට දක්වා ඇත. '***සර්වං ඛලු ඉදං බ්‍රහ්ම අහං බ්‍රහ්මාස්මි තත් ත්වමසි*** ' යනා දි පාඨවලින් පැහැදිලි වන්නේ විශ්වයේ මූල ශක්තිය සහ පුද්ගල ආධ්‍යාත්මය අතර ඇති සම්බන්ධය යි. මේ නිසා තන්ත්‍රයන්හි අපේක්ෂාව ආධ්‍යාත්මික සංවර්ධනය ලෙස ද දැක්විය හැක. තාන්ත්‍රික යෝග ශාස්ත්‍ර බිහිවන්නේ ද මෙහි ප්‍රතිඵලයක් ලෙස යැයි සැළකිය හැකි ය. ආදි යුගයේ පටන් 'තන්ත්‍ර' ගුප්ත ශාස්ත්‍රයක් ලෙස ආචාර්ය වරයා විසින් විශ්වසනීය ශිෂ්‍යයාට උගන්වනු ලැබූ රහසිගත ඥාන සම්භාරයක් වේ. සෑම බ්‍රාහ්මණයෙක් ම තන්ත්‍ර පිළිබඳ විශේෂඥයෙක් නොවේ. උපනිෂද් 'මුනි' හෝ 'ඍෂි' නමින් හැඳින් වූ ආධ්‍යාත්මික නායකයන් ද එසේ නොවේ. ඔවුන් අතුරෙන් එම ශාස්ත්‍රය දන්නේ ඉතා සුළු පිරිසකි.

'තන්ත්‍ර' යන පදයෙහි ව්‍යාකරණානුකූල අදහස පිළිබඳ විමසීමේ දී √තන් ධාතුවට "ෂ්ටන්" ප්‍රත්‍යය එකතුවීමෙන් 'තන්ත්‍ර' පදය නිර්මාණය වී ඇති අතර, මෙහි √තන් ධාතුවෙහි අදහස "පුළුල් බව" යන්නයි. එවිට 'තන්ත්‍ර' යනු ඥානයෙන් විග්‍රහ කළ යුතු ශාස්ත්‍රයයි. "***තන්‍යතෙ විස්තාර්යතෙ ඥානමනෙති තන්ත්‍රම්***" මෙයට අමතරව √තන් ධාතුවට "ත්‍රෛ" ප්‍රත්‍යය එකතු වීමෙන් 'තන්ත්‍ර' පදය සෑදී ඇති අතර, එයින් "පුළුල් ඥානයෙන් යුතු තැනැත්තාට ආරක්ෂාව ලබාදෙන්නා වූ ශාස්ත්‍රය" යන අදහසින් 'තන්ත්‍ර' විග්‍රහ වී ඇත.

බෞද්ධ තන්ත්‍රවල උදාව කවර කාලයක සිදුවූයේ ද යන්න නිර්ණය කිරීම ද දුෂ්කර වූ කටයුත්තකි. මෙය නිර්ණය කිරීම සඳහා උගතුන් නොයෙකුත් උත්සහගෙන ඇතත් ඔවුන් අතර ඒ පිළිබඳ ඒකමතික වූ අදහසක් නොමැත. නමුත් ත්‍රිපිටකය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ තථාගතයන් වහන්සේගේ මූල ශික්ෂාවල මන්ත්‍ර හා තන්ත්‍රයන්ගේ බීජ ඇතුලත්ව ඇති බවයි. තථාගතයන් වහන්සේ සිය අනුගාමිකයන්ට උපදෙස් දෙනවිට ප්‍රකාශ කර ඇත්තේ 'යම් විටෙක මම දීපංකර හා කාශ්‍යප

බුදුවරුන් මෙන් උපත ලැබුවෙමි ද එවිට මා විසින් තාන්ත්‍රික ශික්ෂාවන් නොදෙන ලද බවත් එයට හේතුව මාගේ ශ්‍රාවකයන් මෙම ශික්ෂාවන් ග්‍රහණය කිරීමට සුදුසු තත්වයක් ලබා නොතිබූ නිසාවෙනි. මෙසේ බුදුරදුන්ගෙන් ම ආරම්භ වන්නා වූ බෞද්ධ තන්ත්‍ර ධර්මයන් ආචාර්ය නාගාර්ජුන, ආචාර්ය අසංග වැනි දාර්ශනිකයන් අතින් පෝෂණය වූ බව බොහෝ වියතුන්ගේ මතයයි

තන්ත්‍රික බුදුසමය තුළ ද වන්නා වූ සුවිශේෂී ලක්ෂණයක් ලෙස ගුප්ත ක්‍රමවේද භාවිතය දැකගත හැකි අතර ලෞකික මෙන් ම ලෝකෝත්තර අර්ථ සිද්ධිය මෙයින් අපේක්ෂා කොට ඇත. මේ අනුව මිනිස් මනසෙහි පවත්නා ගැඹුරු ලක්ෂණ දැක්වීම බෞද්ධ සංස්කෘතිය හා සම්බන්ධ කරුණු දැක්වීම සුවිශේෂී වූ ආගමික අර්ථ දැක්වීම පිණිස භවිත වන්නා වූ සංකේත ධර්මයෝ ද, ලෝක පැවැත්ම දක්වන්නා වූ පඤ්ච ජින සංකල්පය ද, ආධ්‍යාත්මික ජීවිතයේ සුවිශේෂී අර්ථ සිද්ධිය සලසන්නා වූ මෙන් ම ආරක්ෂාව සපයන්නා වූ ධාරණී ද, භාවනාව හා පූජා මත පදනම් වූ මණ්ඩලයෝ ද, ලෞකික හා ලෝකෝත්තර අර්ථ සිද්ධිය සඳහා වන්නා වූ මන්ත්‍ර භාවිතය ද, අදෘෂ්‍යමාන වූ බලවේගයන් සක්‍රීය වන්නාවූ නොයෙකුත් මුද්‍රා භාවිතය ද තාන්ත්‍රික බුදුසමය තුළ දක්නට ලැබෙන්නා වූ සුවිශේෂී ගුප්ත ධර්මයෝ ය. මෙකී ධර්මයන්ගේ භාවිතාව පිළිබඳ අධ්‍යයනය අප්‍රකට වුව ද ඒ පිළිබඳ සරල හැඳින්වීමක් හෝ සැපයිම අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් අපේක්ෂා කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ග්‍රන්ථ සංධාර ක්‍රමවේදය භාවිත කෙරේ. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය, සඟරා හා කෝෂ ග්‍රන්ථ පරිශීලනයත්, අන්තර්ජාල භාවිතයෙනුත් දත්ත විශ්ලේෂණයේ දී භාවිතා කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

උපාධ්‍යාය බලදේව, භාරතීය දර්ශන, (1996), පරිවර්තනය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, ඇස්. ගොඩගේ මුද්‍රණ.

සාසනරතන හිමි, මොරටුවේ., (1962) ලක්දිව මහායාන අදහස්, ඇම්. ඩී. ගුණසේන.

නිවන්මඟ, මහායානවාදය, 26 වන කලාපය, (1995) රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය, (2006) හෝමාගම.

Dashupta, SB., (1958), An Introduction to Tantric Buddhism, University of Culcutta.